සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# දෙවන වාර පරීක්ෂණය 2019

09 ශ්‍රේණිය

# චිත්‍ර කලාව

කාලය පැය 03 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

## I කොටස

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා දී ඇති ප්‍රශ්නවලට පහත දැක්වෙන රූප සටහන උපයෝගී කරගෙන පිළිතුරු සපයන්න.



01 පූජනීය ස්ථානවල පිවිසුම් දොරටුව අභියස දැකිය හැකි මෙම සුවිසල් නිර්මාණය ........................................ නමින් හැඳින්වේ.

02 මෙම ඡායාරූපයෙන් දක්වෙන කලා නිර්මාණය ........................................ අසල දැකිය හැක.

03 ප්‍රධාන වශයෙන් ........................................ භාවිතයෙන් මෙම කලා කෘතිය නිමවා ඇත.

04 මෙම නිර්මාණයෙහි ........................................ කට තුළින් විහිදී ගිය දිය රැල්ලක් ආකාරයට ඉහළ කොටස කැටයම් කර ඇත.

05 මෙම කලා කෘතිය ........................................ යුගයට අයත් වේ.

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති වාක්‍යවලට ගැලපෙන නිවැරදි වචනය හිස්තැනට යොදන්න.

06 කවියක් කෙටි කථාවක්'' සඳහා එහි අර්ථය වඩාත් පැහැදිලි වන සේ අඳින ලද චිත්‍ර ........................................ නමින් හඳුන්වයි.

07 මහනුවර දළදා මාළිගයෙහි සිවිලිම චිත්‍ර අතර හංසයින් හතරක් එකට යොදා කළ නිර්මාණයක් අපට හමුවේ. එම සැරසිල්ල ........................................ නමින් හඳුන්වයි.

08 ප්‍රංශයේ මොන්ටිකැන් නුවර අසල ප්‍රාග් ඓතිහාසික ගුහා සිතුවම් සඳහා ප්‍රසිද්ධියක් උසුලන ........................................ ගුහාව පිහිටා ඇත. එහි ඇති අඩි 17 ක් දිග බයිසන් ගව රූව විශිෂ්ඨ නිර්මාණයකි.

09 නිදහස හා ආරක්ෂාව ලබාදීම මෙම මුද්‍රාවෙන් සංකේතවත් කරයි. වැලමිටෙන් අත නවා ඉදිරියට දක්වා ඇත. අවුකන බුදු පිළිමය තුළින් මෙම ........................................ මුද්‍රාව නිරූපණය කරයි.

10 බොහෝ බුදු පිළිම වීරාසන හා පද්මාසන ක්‍රමයට වැඩ සිටිනසේ නිර්මාණය කරයි. ........................................ ක්‍රමයට නිර්මාණය වූ බුදු පිළිමවල යටි පතුල් දෙකම උඩ අතට සිටිනසේ වාඩිවී සිටී.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ වාක්‍ය බැගින් ලියන්න.**

11 ද්විතීක වර්ණ ..................................................

12 ත්‍රිමාණ ලක්ෂණ ..................................................

13 සාදිලිංගම් ..................................................

14 ගෝපුරම් ..................................................

15 වටදාගෙය ..................................................

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති ප්‍රකාශ හරිනම් (✓) ලකුණ ද, වැරදිනම් (×) ලකුණ ද යොදන්න.**

16 උත්සව අවස්ථාවලදී පොල්තෙල් පහන තබන ස්ථානයේ බිම කරන සැරසිල්ල 'අල්පනා' නම් වේ. ( )

17 නිල් සහ රතු යන වර්ණ සමානුපාතිකව මිශ්‍රවීමෙන් සැදෙන වර්ණය ද්විතීක වර්ණයක් වේ. ( )

18 'කෝලම් රටා' යනු රාමසාන් උත්සවයේ දී ඉස්ලාම් බැතිමතුන් කරන සැරසිල්ලකි. ( )

19 පාළි භාෂාවෙන් 'කුමුදුප්පල' ලෙසද, සිංහල භාෂාවෙන් 'දිවමහනෙල්' ලෙසද බිනර මල හඳුන්වයි. ( )

20 අනුරාධපුර යුගයේ කලාත්මක අතින් උසස් මුරගල් නිර්මාණ බිසෝ මාළිගය අසලින් හමුවී ඇත. ( )

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඒ යටින් ඉරක් අඳින්න.**

21 සිංහල සැරසිලි අතර ඇති ''සූර්යා (ඉර)'' සහ ''චන්ද්‍රයා (සඳ)'' යන සැරසිලි අයත්වන්නේ කුමන ඒකකයට ද?

(1) දිව්‍ය (2) නිර්ජීවී (3) උද්භිද (4) සත්ත්ව

22 පාරම්පරික පැදුරු කර්මාන්තයේදී වර්ණ ගැන්වීමේ ක්‍රියාවලිය සඳහා 'රතු' වර්ණය සාදාගැනීම සඳහා යොදාගත් අමුද්‍රව්‍ය වන්නේ,

(1) අමු කහ (2) පතගි ලී (3) ගොකටු කිරි (4) මදටිය කොළ

23 'ධර්ම චක්‍ර මුද්‍රාව' දැක්වෙන බුදු පිළිමයකි

(1) ගල්විහාරයේ හිටි බුදු පිළිමය (2) සමාධි බුදු පිළිමය

(3) අවුකන බුදු පිළිමය (4) සාරානාත් බුදු පිළිමය

24 අනුරාධපුර යුගයේ නිර්මාණය වූ ''සඳකඩ පහණ'' කැටයම් අතරින් පොළොන්නරු යුගයේ සඳකඩ පහණෙහි දැකිය නොහැකි සත්ව රූපය නම්

(1) ඇතා (2) අශ්වයා (3) ගවයා (4) සිංහයා

25 රත්න ප්‍රාසාදය අසල ඇති මුරගලෙහි කැටයම් සඳහා යොදාගෙන <u>නොමැති</u> රූපයක් නම්

(1) වාමන රූප (2) පුන්කලස් රූප (3) මකර රූප (4) නා රජු රූප

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති පින්තූරවලට ගැලපෙන වචනය දී ඇති වචනවලින් තෝරා වරහන් තුළ ලියන්න.**

(ලාක්ෂා / මංජම් / සණ කැපිම / වජ්‍රාසනය / යාලි)

26

(..................................)

27

(..................................)

28

(..................................)

29 

(.........................................)

30 

(.........................................)

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති රූපවලට වඩාත් ගැලපෙන රූපය **A, B, C, D, E** යන රූප වලින් තෝරා එම අක්ෂරය රූපය ඉදිරියේ ඇති තිත් ඉරි මත ලියන්න.

31  ( .......................)  A

32  ( .......................)  B

33  ( .......................)  C

34  ( .......................)  D

35 

( .......................)  E

- අංක 36 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති කලා කෘතිය හඳුනාගෙන ඒ ඇසුරෙන් පිළිතුරු ලියන්න.



36 මෙම නිර්මාණය සඳහා භාවිත 'නාම' 2 ක් ලියන්න.

.............................................................................................................................................

37 මෙය භාවිත කළේ කුමන කාර්යයක් සඳහා ද?

.............................................................................................................................................

38 ශ්‍රී ලංකාවේ තිබෙන මෙම විශිෂ්ට කැටයම් සහිත නිර්මාණය සඳහා යොදාගෙන ඇති මාධ්‍ය කුමක් ද?

.............................................................................................................................................

39 මෙහි ඉදිරිපස දර්ශනය වන කොටසෙහි අලංකාරය පිණිස කැටයම් කර ඇති සැරසිල්ලක් ලියන්න.

.............................................................................................................................................

40 මෙම ඡායාරූපයෙන් දැක්වෙන්නේ පොළොන්නරුවේ කුමන ස්ථානයේ ඇති නිර්මාණය ද?

.............................................................................................................................................

(ලකුණු 1 x 40 = 40)

## III කොටස

- ඔබේ නම / විභාග අංකය හා තෝරාගත් මාතෘකාව චිත්‍රය පසුපිටේ සඳහන් කරන්න.
- **පහත දැක්වෙන ''අ'', ''ආ'' හෝ ''ඉ'' කොටස්වලින් ඔබ කැමති එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් අඳින්න.**

**''අ'' කොටස - චිත්‍ර සංරචනය**

01 නගරයක වෙළඳාම් පොළක්

02 වෙසක් පෝයට සූදානම් වන ගමේ වැසියන්

03 පාසලේ ක්‍රීඩා උළෙලක අවස්ථාවක්

**''ආ'' කොටස - මෝස්තර නිර්මාණය**

04 සරල සත්ත්ව රූප ඇසුරින් ව්‍යාප්ත මෝස්තරයක්

05 නිවසේ කෑම මේසයට එළීමට සුදුසු මේස රෙද්දක්

06 කුෂන් කවරයකට සුදුසු මුළුතල මෝස්තරයක්

**''ඉ'' කොටස - ග්‍රැෆික් චිත්‍ර**

07 ''වන සම්පත සුරකිමු'' තේමාව යටතේ වර්ණවත් පෝස්ටරයක්

08 ''විවිධ ජාතීන් අතර සාමය සහයෝගීතාව'' ඇතිකරවීම අරමුණු කරගත් පෝස්ටරයක්

09 වෙළඳාම්පොළක හඳුන්වාදුන් නව බීම වර්ගයක් සඳහා සුදුසු ලේබලයක් (ලකුණු 30 යි)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2019

**09 ශ්‍රේණිය** **චිත්‍ර කලාව - II** **කාලය විනාඩි 40 යි.**

ආදර්ශ චිත්‍රය හා ශාලාධිපතිට උපදෙස්

* විභාගයට පූර්ව දිනයක කාලච්ඡේදයක් තුළදී මෙම ඇගයීම සිදුකොට චිත්‍ර කලාව **I, III** යන පත්‍රවල ලකුණු සමග එකතු කළ යුතුය.



**සපයා ගත යුතු ද්‍රව්‍ය :-**

01 සුදු පැහැති කඩදාසියකින් ආවරණය කරන ලද හිස් මාරි බිස්කට් පෙට්ටියක්

02 කුඩා ප්‍රමාණයේ මැටි හෝ ප්ලාස්ටික් කලයක්

03 අඩක් ජලය පිරවූ වීදුරු බෝතලයක්

04 ද්‍රව්‍ය තැබීමට ආධාරක පුවරුවක්

**II පත්‍රය**

01. තලය මත රූප සංරචනය කිරීමේ හැකියාව (ල. 05)
02. ද්‍රව්‍යන්ගේ පරිමාව හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 05)
03. සිද්ධාන්ත භාවිතය පිලිබඳ අවබෝධය
    පරිමාණ, පර්යාලෝකනය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස් මට්ටම හා අවකාශ භාවිතය (ල. 05)
04. පැන්සලෙන් රේඛා භාවිතා කිරීමේ හැකියාව හා සමස්ත නිමාව (ල. 05)

(සම්පූර්ණ ලකුණු 20 යි)

**(කාලය විනාඩි 40 යි)**

**සිසුවාට ලබාදිය යුතු උපදෙස් :-**

ඔබේ විභාග අංකය හා ශ්‍රේණිය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව සටහන් කරන්න.

පැන්සලෙන් පමණක් රේඛා අධ්‍යයනය කරන්න. වර්ණ කිරීම අවශ්‍ය නැත.

රේඛා අධ්‍යයනයේදී

01. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම
02. පරිමාණ, පර්යාලෝකන රීති හා ත්‍රිමාණ ලක්ෂණ පැන්සලෙන් මතු කළ යුතුය.
03. දෙන ලද ද්‍රව්‍යන්වල මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම හා සමස්ත නිමාව.

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 01 | කොරවක්ගල | 02 | පොළොන්නරු වටදාගෙය | 03 | කළුගල් | 04 | මකර |
| 05 | පොළොන්නරු | 06 | සන්නිදර්ශන චිත්‍ර | 07 | සිව් හංස පූට්ටුව | 08 | ලැස්කෝ |
| 09 | ආශිර්වාද / අභය | 10 | පද්මාසන | | | | |

11 මූලික වර්ණ දෙකක් සමානුපාතිකව එකතුවී සෑදෙන වර්ණ මේ නමින් හැඳින්වේ.

12 වස්තුවක ඝනකම පෙන්වා ඇඳීම / දිග, පළල, ඝනකම දැක්වීම.

13 අතීතයේදී රතු වර්ණය සාදාගැනීමට භාවිතා කර ඇත.

14 හින්දු ගෘහ නිර්මාණ ශිල්පයේ විශේෂ වූ අංගයක් වන මෙය කෝවිලෙහි ප්‍රධාන දොරටුවට ඉහළින් පිහිටා ඇත.

15 අතීතයේ දී කුඩා ස්ථූප සඳහා සෑදූ පියස්ස, ගෙය ආවරණය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 16 | ✓ | 17 | ✓ | 18 | × | 19 | × | 20 | × | 21 | දිව්‍ය (1) | 22 | පතගි (2) |

| | | | | | |
|---|---|---|---|---|---|
| 23 | සාරානත් බුදු පිළිමය (4) | 24 | ගවයා (3) | 25 | මකර රුව (3) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | ඝන කැපීම | 27 | වජ්‍රාසනය | 28 | මංජම් | 29 | යාලි | 30 | ලාක්ෂා |
| 31 | D | 32 | E | 33 | A | 34 | C | 35 | B |

36 පඩිපෙළ / පියගැටපෙළ / සෝපාන පන්තිය 37 පහළ මළුවකින් ඉහළ මළුවට නැගීම සඳහා

38 කළුගල් 39 වාමන රූප, වජ්‍ර සංකේත, පළාපෙති, ලියවැල් 40 වටදාගෙය අසල

I කොටසට ලකුණු 40 යි.

II කොටසට ලකුණු 30 යි.

III කොටසට ලකුණු 30 යි. මුළු ලකුණු 100 යි.